ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සාකච්ඡා

ඩිජිටල්කරණය සහ කෘත්‍රිම බුද්ධිය වැනි නව ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පවතින ද්විපාර්ශ්වික හවුල්කාරිත්වය යටතේ CERT- ඉන්ඩියා ආයතනයේ අධ්‍යක්ෂ ජනෙරාල් ආචාර්ය සංජේ බාහ්ල් සහ ඉන්දීය රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ ලේකම් (සයිබර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු) අමිත් ශුක්ලා මහතා ප්‍රමුඛ දූත පිරිසක් සයිබර් ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කොළඹට පැමිණියහ.

2. මෙම සංචාරය අතරතුර දී දූත පිරිස නියෝජ්‍ය ඩිජිටල් ආර්ථික අමාත්‍ය ගරු එරංග වීරරත්න මැතිතුමා හමු වී සයිබර් ආරක්ෂක පාලන රාමු, කෘත්‍රිම බුද්ධිය විසින් සයිබර් ආරක්ෂාවට මතු කර තිබෙන තර්ජන, තර්ජන තක්සේරු හුවමාරු කරගැනීමේ අවශ්‍යතාවය සහ ධාරිතා සංවර්ධනය, සිදුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීම යනාදිය සම්බන්ධයෙන් CERT - ඉන්ඩියා ආයතනය විසින් යොදා ගනු ලබන හොඳම භාවිතයන් සම්බන්ධයෙන් සාකච්ඡා කළහ.

3. දූත පිරිස කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා ද හමු වී සුරක්ෂිත මූල්‍ය පද්ධතියක් සහ ඩිජිටල් ආර්ථිකයක් සඳහා වන පොදු සන්දර්භය තුළ සයිබර් ආරක්ෂක සහයෝගීතාවය සම්බන්ධයෙන් සාකච්ඡා කළහ. ඉන්දීය දූත පිරිස සහ ශ්‍රී ලංකා CERT සභාපති තිලක් පතිරගේ මහතා සහ ශ්‍රී ලංකා CERT ප්‍රධාන විධායක අධ්‍යක්ෂ ආචාර්ය කණිෂ්ක කරුණාසේන මහතා අතර දැනුම හුවමාරුව, ධාරිතා සංවර්ධනය, සයිබර් අර්බුද කළමනාකරණය සහ ක්වොන්ටම් පරිගණනය සහ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ජාතික මට්ටමේ විවිධ උපායමාර්ග යනාදි ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය වර්ධනය කරගත හැකි ආකාර පිළිබඳව සාකච්ඡා ද පැවැත්විණ.

****

කොළඹ

2026 ඔක්තෝබර් 06